# 5 වන පරිච්ඡේදය


# ලෝකයේ ප්‍රධාන කෘෂිකාර්මික භූමි පරිභෝග වර්ග

කෘෂිකර්මය මිනිස් ශිෂ්ටාචාරයේ ඉතා ඈත අවධියක සිට පැවතෙන්නකි. කලින් කල විවිධ වෙනස්කම්වලට භාජනය වෙමින් මේ වන විට ඉතාමත් සංකීර්ණ මිනිස් කටයුත්තක් බවට පත් ව ඇත. ආහාර ලබා ගැනීම සඳහාත් කාර්මික අමුද්‍රව්‍ය ලබා ගැනීම සඳහාත් කෘෂිකර්මය ඉතා වැදගත් ය. ජන සංඛ්‍යාව වැඩි වීමත් සමග ම ආහාර සඳහා අවශ්‍ය වී, තිරිඟු, ඉරිඟු වැනි ධාන්‍ය වර්ගත් එළවළු, පලතුරු වැනි බෝග වගාවනුත් ව්‍යාප්ත විය. ජනතාවට අවශ්‍ය අනෙකුත් භාණ්ඩ නිෂ්පාදනය සඳහා කර්මාන්ත ඇති වූ අතර කාර්මික අමුද්‍රව්‍ය වශයෙන් රබර්, උක්, කපු, ජුට් වැනි වගාවන් ව්‍යාප්ත විය.

කෘෂිකාර්මික කටයුතු ව්‍යාප්ත වීමේ දී ජන සංඛ්‍යාවේ ව්‍යාප්තිය ද බලපා ඇත. ජනාකීර්ණ ප්‍රදේශවල ඉඩම් හිඟ බැවින් දියුණු තාක්ෂණික ක්‍රම උපයෝග කර ගෙන සියුම් පාරිභෝගික වගාවන් ව්‍යාප්ත වූ අතර ජන හීන ප්‍රදේශවල විශාල බිම් කට්ටි උපයෝගී කර ගනිමින් විස්තෘත වගාව ව්‍යාප්ත විය. මින් පැහැදිලි වන්නේ භූ විෂමතාව, පස, දේශගුණය මෙන් ම ජන සංඛ්‍යාව වෙළෙඳපොළ, තාක්ෂණය වැනි කරුණු මත කෘෂිකාර්මික කටයුතු තීරණය වන බව යි. ඒ කරුණු මත වර්තමානයේ දී කෘෂිකාර්මික වර්ගීකරණ හඳුන්වා දී ඇත. ඒ අනුව පහත සඳහන් කෘෂිකාර්මික වර්ග පිළිබඳ ව මෙහි දී අවධානය යොමු කෙරේ.

1. විස්තෘත වාණිජ කෘෂිකර්මය
2. සියුම් පාරිභෝගික කෘෂිකර්මය
3. සත්ත්වපාලනය
4. මධ්‍යධරණී කෘෂිකර්මය
5. වතු කෘෂිකර්මය

5.1 සිතියමෙන් කෘෂිකාර්මික භූමි පරිභෝග වර්ග සරල ව දක්වා ඇත.




**5.1 සිතියම**
**ලෝකයේ ප්‍රධාන කෘෂිකාර්මික වර්ග**

## විස්තෘත වාණිජ කෘෂිකර්මය

වැඩි ප්‍රාග්ධනයක් ආයෝජනය කරමින් විශාල ගොවිපළවල වාණිජ පදනමකින් ධාන්‍ය වගා කිරීම මෙම කෘෂිකර්මයේ ලක්ෂණයකි. තිරිඟු, ඉරිඟු, ඕට්ස්, රයි, බාර්ලි වගා කරන අතර තිරිඟු වගාව ඉන් ප්‍රධානත්වයක් උසුලයි. තිරිඟු ජාත්‍යන්තර වෙළෙඳපොළේ ප්‍රධානත්වයක් හිමි කර ගෙන ඇත. පිෂ්ඨය බහුල ආහාරයකි. විවිධ දේශගුණික තත්ත්වයන් යටතේ වගා කළ හැකි තිරිඟු වර්ග ගණනාවක් තිබීම ද වැදගත් කරුණකි.

## තිරිඟු වගාවේ ව්‍යාප්තිය

- උතුරු ඇමරිකාවේ තිරිඟු පටිය (ඩැකෝටා, මොන්ටානා, කැන්සාස්, කොලරාඩෝ වැනි විශාල වගා බිම්, ඔක්ලහෝමා ප්‍රදේශ)
- දකුණු ඇමරිකාවේ ආර්ජන්ටිනා ප්‍රදේශ
- ද. ඕස්ට්‍රේලියාවේ සිට ගිනිකොන වික්ටෝරියා දක්වා ප්‍රදේශය
- රුසියාව, උතුරු චීනය, ඉන්දියාව, පාකිස්ථානය ආදී ප්‍රදේශ

ඕස්ට්‍රේලියාව, කැනඩාව, ආර්ජන්ටිනාව ලෝක වෙළෙඳපොළට තිරිඟු සපයන ප්‍රධාන රටවල් වේ. බටහිර යුරෝපා රටවලින් තිරිඟු සඳහා විශාල ඉල්ලුමක් පවතී.

## වගාවට බලපාන සාධක

- $13^0$ - $21^0$c දක්වා සාමාන්‍ය උෂ්ණත්වය
- 375 - 875mm අතර සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනය
- පැළ වැඩෙන කාලයේ සිසිල් තෙත් පරිසරයක් හා ඉන් පසුව උණුසුම් සූර්යාලෝකය සහිත වියළි කාලගුණයක්.
- ජලවහනය සහිත රැළිබිම් හෝ සමතලා බිම්
- චර්නෝසම් පස
- ප්‍රාග්ධනය, වෙළෙඳපොළ, ප්‍රවාහනය, නවීන ශිල්පීය ඥානය



5.1 රූපය
තිරිඟු වගා බිමක්

## ප්‍රවණතා (තිරිඟු වගාව)

- බිම සකස් කිරීමේ සිට අස්වැන්න නෙළීම දක්වා යාන්ත්‍රීකරණය වැඩි වීම.
- පොහොර භාවිතය වැඩි වීම.
- උසස් වර්ගයේ බීජ වර්ග භාවිතය.
- තාක්ෂණ උපාය මාර්ග වැඩි වැඩියෙන් භාවිතය.
- තිරිඟු වගා බිම්වල විවිධාංගීකරණය (නිදසුන්: තිරිඟු වගා බිම්වල සත්ත්ව පාලනය ද කෙරේ.)

## ගැටලු

- ස්වාභාවික උවදුරු. (නියග, වැසි නො ලැබීම, කෘමි උවදුරු)
- පරිවහන වියදම් අධික වීම.
- යෙදවුම් මිල අධික වීම.
- දීර්ඝ කාලයක් එක ම බිමේ වගා කිරීම නිසා පස නිසරු වීම.




5.2 සිතියම
ලෝකයේ තිරිඟු වගා කරන ප්‍රදේශ

ක්‍රියාකාරකම 1


- ලෝකයේ තිරිඟු වගාව ආශ්‍රිත නූතන ප්‍රවණතා පිළිබඳ තොරතුරු රැස් කරන්න.
- තිරිඟු ජාත්‍යන්තර වෙළෙඳපොළේ වැඩි වශයෙන් අලෙවි වන ධාන්‍ය වර්ගයක් බවට පත් වීමට බලපා ඇති හේතු පැහැදිලි කරන්න.

## සියුම් පාරිභෝගික කෘෂිකර්මය

ගොවි බිමේ ප්‍රමාණය, නිෂ්පාදන පරමාර්ථය, වගා ක්‍රම, තාක්ෂණය, අස්වනු ප්‍රමාණය, නිෂ්පාදනයෙන් වෙළෙඳාමට ඇතුළු වන අතිරික්ත ප්‍රමාණය වැනි කරුණු අනුව ලෝකයේ අනෙක් කෘෂිකාර්මික ක්‍රමවලින් වෙනස් ව කුඩා බිම් ඒකකයකින් වැඩි ඵලදාවක් ලැබෙන පරිදි කර ගෙන යනු ලබන වගාව සියුම් පාරිභෝගික කෘෂිකර්මය ලෙස හැඳින්වේ. ලෝකයේ ජනාකීර්ණ ප්‍රදේශවල වී වගාව ප්‍රධාන වශයෙන් සියුම් පාරිභෝගික කෘෂිකර්මය යටතේ පවත්වා ගෙන යනු ලැබේ.

ඉන්දියාව, චීනය, ජපානය, පාකිස්ථානය, දකුණු කොරියාව, මියන්මාරය, තායිලන්තය, කාම්බෝජය, උතුරු හා දකුණු වියට්නාමය, ශ්‍රී ලංකාව, බංගලාදේශය, මැලේසියාව, පිලිපීනය, ඉන්දුනීසියාව වැනි රටවල් මේ සඳහා නිදසුන් ය. සියුම් පාරිභෝගික වගාව යටතේ වී වගා කරන ප්‍රධාන කලාපය ලෙස ආසියාතික කලාපය වැදගත් ය. මෙම කලාපයේ භෞතික සාධක වී වගාව සඳහා ඉතාමත් යෝග්‍ය වේ. වී වගාව ආශ්‍රිත විවිධ කාර්යයන් සඳහා මිනිස් ශ්‍රමය බහුල ව යොදා ගන්නා බැවින් මෙය ශ්‍රම සූක්ෂම කෘෂිකාර්මික ක්‍රමයක් ලෙස ද හැඳින්වේ.

ආසියාවෙන් බැහැර වී වගා කරන ප්‍රදේශ ද වේ. උතුරු ඇමරිකාවේ පහළ මිසිසිපි නිම්නය, කැලිෆෝර්නියාවේ සැක්‍රමැන්ටෝ නිම්නය, ඉතාලියේ පෝ ගංගාධාරය, අප්‍රිකාවේ නයිල් ඩෙල්ටාව, නැගෙනහිර බ්‍රසීලයේ වෙරළබඩ ප්‍රදේශය, මරේ ඩාලිං නිම්නය එම ප්‍රදේශවලට නිදසුන් ය.




**5.3 සිතියම**
**ලෝකයේ වී වගා කෙරෙන ප්‍රදේශ**

- වගාවට බලපාන සාධක

  භෞතික සාධක
  - ❑ උෂ්ණත්වය $27^0c$ පමණ
  - ❑ වර්ෂාපතනය 2000mm පමණ
  - ❑ දියළු පස (ගංගා නිම්න හා ඩෙල්ටා)
  - ❑ තැනිතලා හෝ රැළි බිම

  මානව සාධක
  - ❑ ශ්‍රමය, ප්‍රාග්ධනය, වෙළෙඳපොළ, ප්‍රවාහනය

- නව ප්‍රවණතා
  - ❑ උසස් වර්ගයේ බීජ වර්ග භාවිතය (HYV)
    කෙටි කාලයකින් අස්වැන්න ලබා දෙන බීජ වර්ග භාවිතය ප්‍රචලිත කිරීම මඟින් කුඩා බිම් ඒකකයකින් ඉහළ අස්වැන්නක් බලාපොරොත්තු වීම.
  - ❑ ගොවිපළ යාන්ත්‍රික වීම. (සී සෑම, අස්වනු කැපීම, පෑගීම වැනි දේ)
  - ❑ සහල් සැකසීමේ ක්‍රම වෙනස් වීම.
    - සහල් පිටි බවට හැර වීම.
    - ඇසුරුම් ක්‍රම.
    - සහල් පිටි මඟින් ක්ෂණික ආහාර වර්ග සැකසීම.



**5.2 රූපය**
**වී කරල් සහිත ගසක්**

- ගැටලු
  - ❑ ගොවි බිම කැබලි වීම.
  - ❑ වගා බිම් සීමිත වීම.
  - ❑ යෙදවුම් මිල අධික වීම.
  - ❑ ජල හිඟය
  - ❑ ගොවීන්ගේ නූගත්කම.
  - ❑ දුප්පත්කම.
  - ❑ ස්වාභාවික උවදුරු - නියඟ, ගං වතුර
  - ❑ වී මිල ස්ථාවර නොවීම
  - ❑ ගොවීන් ණය බරින් පීඩා විඳීම

ක්‍රියාකාරකම 2

- ලෝක වෙළෙඳපොළට සහල් අපනයනය කරන රටවල් පහක් නම් කරන්න.
- නූතන ලෝකයේ සහල් වෙළෙඳාමේ විශේෂ ලක්ෂණ මොනවා ද?
- ආසියාවෙන් බැහැර වී වගා කරන ප්‍රදේශ ලෝක සිතියමක ලකුණු කර නම් කරන්න.

## සත්ත්වපාලනය

මිනිසාට අවශ්‍ය ආහාර ද්‍රව්‍ය ලබා ගැනීම සඳහාත් කර්මාන්ත සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය ලබා ගැනීම සඳහාත් ලෝකයේ විවිධ රටවල සත්ත්වපාලනය කර ගෙන යනු ලැබේ. මිනිසාගේ ආහාරයේ වැදගත් තැනක් ගන්නා සත්ත්ව ද්‍රව්‍ය අතර මස් හා කිරි වැදගත් ය. ගවයින්, බැටළුවන්, එළුවන් හා ඌරන් මස් පිණිස ඇති කරන සතුන් අතර ප්‍රධාන වේ. කර්මාන්ත සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය වශයෙන් මස්, කිරි, හම් සහ ලොම් යොදා ගනු ලැබේ.

### මස් හා කිරි පිණිස සතුන් ඇති කරන රටවල්

- ඇ. එ. ජනපදය
- නවසීලන්තය
- ස්විට්සර්ලන්තය
- ආර්ජන්ටිනාව
- ඕස්ට්‍රේලියාව
- ඩෙන්මාර්කය
- නෙදර්ලන්තය

ඇමරිකා එක්සත් ජනපදය, ආර්ජන්ටිනාව, ඩෙන්මාර්කය, නවසීලන්තය, ඕස්ට්‍රේලියාව වැනි රටවල් සත්ත්ව නිෂ්පාදන අපනයන කරනු ලැබේ.


### සත්ත්වපාලනය කෙරෙහි බලපාන සාධක

භෞතික සාධක

- විශාල තෘණ භූමි (උතුරු ඇමරිකාවේ - ප්‍රෙයරීස්, දකුණු ඇමරිකාවේ - පැම්පාස්, කැම්පෝස්, ලානෝස් තණ බිම්, රුසියාවේ - ස්ටෙප්ස්, ඕස්ට්‍රේලියාවේ - ඩවුන්ස්, දකුණු අප්‍රිකාවේ වෙල්ඩ් නිදසුන් ය)
- අර්ධ ශුෂ්ක හා සෞම්‍ය දේශගුණය
- ජල පහසුව

### මානව සාධක

- ප්‍රවාහන පහසුව
- වෙළෙඳපොළ
- ශීතකරණ හා ගබඩා පහසුව
- සංවිධානය හා කළමනාකරණය
- නවීන ශිල්පක්‍රම යොදා ගැනීම




5.4 සිතියම

ලෝකයේ මස් හා කිරි සඳහා සත්ත්වපාලනය කරන රටවල්

⏩ ප්‍රවණතා

- ❑ නව නිෂ්පාදන ක්‍රම භාවිතය පුළුල් වීම.
- ❑ කිරි නිෂ්පාදනය ඉහළ මට්ටමකට ළඟා වීම.
- ❑ නව නිෂ්පාදන වෙළෙඳපොළට හඳුන්වාදීම.
- ❑ කුඩා ගොවීන් සමුපකාර මට්ටමින් සංවිධානය වීම.
- ❑ ප්‍රදේශයේ ජල සම්පාදන පහසුකම් පුළුල් වීම.
- ❑ නිෂ්පාදන විවිධාංගීකරණය (මස්)
- ❑ සත්ත්ව නිෂ්පාදන ප්‍රදේශ තුළ සත්ත්ව ආහාර සඳහා තිරිඟු, ඉරිඟු බෝග වගා කිරීම.
- ❑ දෙමුහුන් කරන ලද සත්ත්ව වර්ග බෝකිරීම.

⏩ ගැටලු

- ❑ තෘණ භූමිවල ප්‍රමාණය අඩු වීම.
- ❑ ප්‍රාග්ධන හිගය
- ❑ පරිසර දූෂණය
- ❑ නිෂ්පාදන වියදම් අධික වීම
- ❑ සතුන්ට වැළදෙන වසංගත රෝග
- ❑ අවශ්‍ය ශ්‍රමිකයන් නොමැති වීම.

ක්‍රියාකාරකම් 3

- ❖ මස් පිණිස ගවයින් ඇති කරන ප්‍රදේශ තුනක් ද කිරි පිණිස ගවයින් ඇති කරන ප්‍රදේශ තුනක් ද ලෝක ආකෘති සිතියමක ලකුණු කරන්න.
- ❖ කිරි ආශ්‍රිත නිෂ්පාදනවල ලේඛනයක් පිළියෙල කරන්න.
- ❖ කාර්මික අමුද්‍රව්‍ය වශයෙන් යොදා ගන්නා සත්ත්ව නිෂ්පාදන නම් කරන්න.

## මධ්‍යධරණී කෘෂිකර්මය

මෘදු තෙත් සිසිරයක් හා උෂ්ණ වියළි ගිම්හානයක් ඇති මධ්‍යධරණී ද්‍රෝණිය වටා ඇති ප්‍රදේශවලත් ඊට සමාන දේශගුණයක් ඇති ලෝකයේ තවත් ප්‍රදේශ කිපයකත් ක්‍රියාත්මක වන කෘෂිකාර්මික ක්‍රමයට මධ්‍යධරණී කෘෂිකර්මය යන නම භාවිත කෙරේ.

⏩ ව්‍යාප්තිය

- ❑ මධ්‍යධරණී මුහුදට යාබද අප්‍රිකා යුරෝපා ප්‍රදේශවල මධ්‍යධරණී වෙරළ ආශ්‍රිත ව ප්‍රධාන වශයෙන් ව්‍යාප්ත ව ඇත. (ස්පාඤ්ඤයේ හා ප්‍රංශයේ දකුණු වෙරළ, ඉතාලිය, ග්‍රීසිය, සිසිලිය, ඊශ්‍රායලය, ජෝර්දානය, සිරියාවේ බටහිර වෙරළ, ඊජිප්තුව, ඇල්ජීරියාව, මොරොක්කෝව) මධ්‍යධරණී මුහුදු ප්‍රදේශය හැරුණු විට කැලිෆෝර්නියාව, දකුණු අප්‍රිකාව, මධ්‍යම චිලී, ඕස්ට්‍රේලියාවේ නිරිත හා දකුණු කොටස, නවසීලන්තය යන රටවල ද ව්‍යාප්ත වී ඇත.

⏩ බලපාන සාධක

- ❑ දිගු ගිම්හාන නියගය
- ❑ මෘදු සිසිර සෘතුව
- ❑ භූ විෂමතාව නිසා ඇති වූ දේශගුණික තත්ත්වයන්

⏩ වගා කරන බෝග සහ ඇති කරන සතුන්

- ❑ සිසිර ධාන්‍ය වගාව - තිරිඟු, ඉරිඟු, බාර්ලි, රයි, ඕට්ස් වැනි ධාන්‍ය
- ❑ එළවළු වගාව - ජනාකීර්ණ නාගරික වෙළෙඳපොළට එළවළු සැපයීම අරමුණු කර ගෙන කැරට්, තක්කාලි, බෝංචි, ළූණු, පිපිඤ්ඤා වැනි එළවළු.
- ❑ පලතුරු වගාව - ඔලිව්, මිදි, දොඩම්. ස්ට්‍රෝබෙරි, රටඉඳි, පැඟිරි පවුලට අයත් පලතුරුවලට ප්‍රසිද්ධ ය.
- ❑ සත්ත්වපාලනය - එළුවන්, බැටළුවන්, ඌරන්

මෙම කලාපයේ වගා කරන මිදි වැඩි කොටසක් වයින් නිෂ්පාදනය සඳහා යොදා ගන්නා අතර, වයින් ප්‍රධාන පානයක් ලෙස ද භාවිත කෙරේ.

⏩ ප්‍රවණතා

- ❑ ඒ ඒ ප්‍රදේශවලට උචිත විශේෂිත වාසි අත් කර දෙන වගා කටයුතු සඳහා නැඹුරු වීම.

  උදා:- සැක්‍රමැන්ටෝ හා සැන්ප්‍රැන්සිස්කෝවල මිදි වගාව
  යුරෝපයේ තක්කාලි වගාව ජනප්‍රිය වීම

## වතු කෘෂිකර්මය


මධ්‍ය අක්ෂාංශීය වෙළෙඳපොළට අවශ්‍ය විශේෂිත නිෂ්පාදන සමහරක් ලබා ගැනීමට නිවර්තන හා උපනිවර්තන ප්‍රදේශවල භූමිය හා ශ්‍රමය යොදා ගැනීමෙන් සංවිධානාත්මක ව කරනු ලබන කෘෂිකාර්මික ක්‍රමයක් ලෙස වතු කෘෂිකර්මය හැඳින්වේ.

- ව්‍යාප්තිය

  - ඇමරිකානු කලාපය - උතුරු, මධ්‍යම හා දකුණු ඇමරිකානු රටවල නිවර්තන හා උපනිවර්තන ප්‍රදේශ
  - අප්‍රිකානු කලාපය - බටහිර හා නැගෙනහිර අප්‍රිකානු රටවල්
  - ආසියානු කලාපය - දකුණු හා අග්නිදිග ආසියාවේ නිවර්තන හා උපනිවර්තන ප්‍රදේශ

- විශේෂ වැවිලි සඳහා යෝග්‍ය රටවල්

  - තේ - ශ්‍රී ලංකාව, ඉන්දියාව, චීනය, තායිවානය, ජපානය, ඉන්දුනීසියාව, ටැංසානියාව, උගන්ඩාව, කෙන්යාව, මොසැම්බික් ආදි ප්‍රදේශ.
  - පොල් - ශ්‍රී ලංකාව, ඉන්දුනීසියාව, මැලේසියාව, පිලිපීනය, පැපුවානිව්ගිනි, සොලමන් දූපත්, තායිලන්තය, වියට්නාමය
  - රබර් - මලයාසියාව, ඉන්දුනීසියාව, තායිලන්තය, ඉන්දියාව, ශ්‍රී ලංකාව, චීනය, අප්‍රිකාව, වියට්නාමය.
  - කෝපි - ඉන්දියාව, ශ්‍රී ලංකාව, සුමාත්‍රා, ජාවා, පිලිපීනය, යේමනය, ඇංගෝලාව, අයිවරි කොස්ට්, මැලගසි, ඉතියෝපියාව, උගන්ඩාව, මෙක්සිකෝව, ගෝතමාලා, නිකරගුවා, ජැමෙයිකා, එල්සැල්වදෝර්, කොස්ටාරිකා, බ්‍රසීලය, පීරු, ඉක්වදෝර් ආදි රටවල්.
  - කොකෝවා - ඝානාව, නයිජීරියාව, කැමරූන්, අයිවරි කෝස්ට්, වෙනිසියුලාව, ට්‍රිනිඩෑඩ්, මෙක්සිකෝව, ඉක්වදෝර්, කොලොම්බියාව ආදි රටවල්.
  - කපු - ඇමරිකා එක්සත්ජනපදය, චීනය, යුක්රේනය, උස්බෙකිස්ථානය, ඉන්දියාව, පාකිස්ථානය, ඊජිප්තුව ආදි රටවල්
  - උක් - කියුබාව, චීනය, බ්‍රසීලය, ඉන්දියාව, පාකිස්ථානය, මෙක්සිකෝව




**5.5 සිතියම**
**ලෝකයේ තේ වගා කෙරෙන ප්‍රධාන ප්‍රදේශ**

## ප්‍රධාන ලක්ෂණ

- දිගු කාලයක් අස්වනු ලබා දෙන ස්ථිර බෝග එක් ප්‍රදේශයක එක බෝගයක් වශයෙන් වගා කිරීම.
  උදා:- තේ, රබර්, පොල්, කපු
- එක ම බෝගයක් විශාල වතු වශයෙන් තිබීම.
- අඩු ජන සංඛ්‍යාවක් ඇති ප්‍රදේශවල ව්‍යාප්ත වීම.
- වැටුපට සේවය කරන කම්කරු පිරිසක් සිටීම.
- දැඩි ශ්‍රම සංවිධානයක් තිබීම.
- සුවිශේෂ කළමනාකරණයක් පැවතීම.
- විශාල ප්‍රාග්ධනයක් ආයෝජනය කිරීම.
- වෙළෙඳපොළ මුල් කර ගෙන වගා කිරීම.
- තාක්ෂණය බහුල ව යොදා ගැනීම.



5.3 රූපය
තේ වගා බිමක්



5.4 රූපය
කොකෝවා වගා බිමක්



5.5 රූපය
කෝපි වගාවක්

## ප්‍රවණතා

- මුල දී අපනයනය මුල් කර ගත්ත ද වර්තමානයේ දේශීය පරිභෝජනයට නැඹුරු වීම.
- නිතර මිල උච්චාවචනයේ පාඩුව වළකා ගැනීමට මිශ්‍ර බෝග වගාවන් ක්‍රියාත්මක වීම.
  උදා:- ශ්‍රී ලංකාවේ රබර් වගාව සමග කොකෝවා වැවීම
  ශ්‍රී ලංකාවේ පොල් වගාව සමග අන්නාසි වැවීම
- වතු කම්කරු සුභසාධනය පුළුල් වීම සහ ජීවන තත්ත්වය ඉහළ යාම.
- නව තාක්ෂණය වැඩි වැඩියෙන් හඳුන්වා දීම.
- පොහොර භාවිතය ප්‍රචලිත වීම.
- නිමි භාණ්ඩ ලෙසට අපනයනය කිරීම.
  උදා:- ශ්‍රී ලංකාවේ රබර්වලින් අත් මේස්, ටයර්



5.6 රූපය
රබර් වගා බිමක්

## ගැටලු

- නඩත්තු වියදම් ඉහළ යාම.
- ඇතැම් නිෂ්පාදනවලට ආදේශක ඉදිරිපත් වීම නිසා ඉල්ලුම පහත වැටීම.
  උදා:- තේ, කෝපි ආදී පාන වර්ගවලට කොකාකෝලා වැනි
  බීම වර්ග ආදේශ වීම.
- සේවක ගැටලු / වැඩ වර්ජන ක්‍රියාත්මක වීම.
- විශාල වතු පෞද්ගලිකරණය කිරීම.
  උදා:- ශ්‍රී ලංකාව



5.7 රූපය
පොල් වගා බිමක්



5.8 රූපය
කපු ගසක්

> ක්‍රියාකාරකම 3
>
> ❖ ලෝකයේ තේ වගා කරන රටවල් තුනක් ද,
> රබර් වගා කරන රටවල් තුනක් ද,
> ❖ පොල් වගා කරන රටවල් තුනක් ද සිතියමක ලකුණු කර නම් කරන්න.
> ❖ මධ්‍යධරණී කෘෂිකර්මය කෙරෙන ප්‍රධාන රටවල් ලෝක සිතියමක ලකුණු කර නම් කරන්න.
> ❖ ලෝකයේ වතු බෝග පදනම් කර ගත් කාර්මික නිෂ්පාදන ඇතුළත් ලේඛනයක් පිළියෙල කරන්න.